# ශ්‍රී ලංකාවඃ වධ හිංසා පැමිණවීම- ' මට දෙතුන් පාරක්ම සිහි නැති වුනා'

කොළඹ පොලිස් සිර මැදිරියක දී තමා වධහිංසා වලට ලක්වෙමින් ගත කළ අසීරු දවස් තේවන් ( අන්වර්ථ නාමය) විසින් ආවර්ජනය කරන්නට සමත් වුයේය.

මෙම ආවර්ජනය, ඔහුට තමා මුහුණ දුන් බෙදවාචකය නැවත සිහිපත් කරන්නට අවස්ථාවක් ලබා දුන් අතර, මෙවැනි වධහිංසා පැමිණවීමකට තමා මුහුණ දුන්නේ දැයි, තමාට ම විශ්වාස කළ නොහැකි බව තේවන් ප්‍රකාශ කරයි.

"මගේ ඇස් වහලා, අත් දෙක පිටි පස්සට ගැට ගැහුවා. සමහර වේලාවට අපේ ඔළු වලින් බිත්ති වලට ගැහුවා. එහෙම නැත්නම් පපුවට පයින් ගැහුවා. හුඟක් වේලාවට එක්කෝ මම බාගෙට එහෙම නැත්නම් සම්පූර්ණයෙන්ම සිහිය නැතිවයි හිටියේ. මම ඔළුව ඉස්සුවහොත් මට ආයේමත් ගහන්නට පටන් ගන්නවා. ඔවුන් හැම තිස්සේම කිව්වේ 'උඹ එල්. ටී. ටී. ඊ. කාරයෙක් කියලා පිළි අරගෙන මේ කොළ වලට අත්සන් කරපන් කියලයි'.

2008 වර්ෂයේ අවසාන භාගයේ තේවන් වවුනියාවේ කඩයක සේවය කරමින් සිටියේය.

එම වර්ෂයේ නොවැම්බර් මාසයේ දී යුද්ධය ඉතා දරුණු ලෙස පැතිරී යමින් තිබූ අවස්ථාවේ තේවන් සිය මිතුරෙක් සමඟ කොළඹ බලා එමින් සිටිය දී සුදු වෑන් රථයකින් පැමිණි කණ්ඩායමක් විසින් ඔවුන් පැහැර ගත්තේය.

ඔවුන් දෙදෙනා ගේ ඇස් වෙලන ලද අතර රැඳවුම් මධ්‍යස්ථානයක රඳවා ගන්නා ලදී. දිනපතා ම ඔවුන් වධ හිංසා වලට ලක් කරන ලද අතර, තමන් රඳවා ගෙන සිටින්නේ පොලිස් ස්ථානයක බව තේරුම් ගත්තේ දින තුනක් ඉක්ම යාමෙන් පසුවය.

"දවස් තුනක් යන කම්ම අපට මොකද වුනේ කියලා අපිට දැන ගන්න විධියක් තිබුනේ නෑ. ඔවුන් අපිට ඔහේ ගැහුවා. කිසිම ප්‍රශ්නයක් ඇහුවේ නෑ. ගහනවා. වධ දෙනවා. එකම තැන එත් හැම තිස්සේම කාමර මාරු කළා. සමහර වෙලාවලට මට මගේ යාළුවාට ගහන කොට අඬනවා ඇහෙනවා. එයාටත් මම කෑ ගහනවා ඇහෙන්ඩ ඇති." තේවන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කරමින් කියා සිටියේය.

## අවමන් කිරීමේ රටාව

තේවන් ගේ නිදර්ශනය, යම් කිසි තැනැත්තෙක් ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍යයක් සඳහා ආයුධ සන්නද්ධව සටන් කළ එල්. ටී. ටී. ඊ. සංවිධානයේ සැකකරුවෙක් ලෙස සැක කරනු ලැබුවහොත්, ඔහුට හෝ ඇයට ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාව විසින් සලකනු ලබන අවමන් සහගත ආකාරය මැනවින් විදහා දක්වයි.

ශ්‍රී ලංකා ආණ්ඩුවත් එල්. ටී. ටී. ඊ. සංවිධානයත් අතර 26 වසරක් පුරා පැවති යුද්ධය 2009 නිමාවට පත් වුයේය. එහෙත් යුද්ධ සමයේ සිය ආරක්ෂාව තහවුරු කර ගැනීම පිණිස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යොදා ගත් අවමන් සහගත උපක්‍රම එදා මෙන්ම අදත් එලෙසම පවත්වා ගෙන යයි.

ජනමාධ්‍යවේදීන්, නීතිඥයින්, බිම් මට්ටමේ ක්‍රියාධරයන් ඇතුළු බලධාරීන් විවේචනය කරන ඕනෑම තැනැත්තෙක්, භයානක ආරක්ෂක නීති යටතේ අත් අංඩගුවට ගෙන ඔවුන්ට බාහිර ලෝකය සමඟ කිසිදු ගණුදෙනුවකට ඉඩ නොතබා රඳවා තබයි.

1980 ගණන් වල සිට භාවිතයේ පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත ආණ්ඩු සිය විවේචකයින් නිහඬ කිරීම පිණිස පාවිච්චි කරන ප්‍රධාන මෙවලම වෙයි. මෙම පණත යටතේ චෝදනාවක් හෝ නඩු විභාගයකින් තොරව ඕනෑම තැනැත්තෙක් අත්අංඩගුවට ගෙන මාස 18ක් රඳවා තබා ගත හැකිය. එකී රැඳවියන්ට නීතිඥ සහාය ලබා ගැනීමේ අයිතිය අහිමි කරමින් ඔවුහු අද්භූත රැඳවුම් මධ්‍යස්ථානයන් හි රඳවනු ලබයි. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථානුකූලව වධහිංසා පැමිණ

විම තහනම් කර ඇතත් මෙම රැඳවියන් නිරායාසයෙන්ම වධහිංසා පැමිණ විමේ ගොදුරුක් බවට පත් වෙයි.

ඇතැම් විට බලධාරීන් නිර්නාමිකව සිය විරුද්ධවාදීන්ට හිරිහැර කිරීමට හා පහර දීමට යොදා ගන්නා උපක්‍රම නීතියානුකූල බව කියා සිටියි. හඳුනා ගත නොහැකි ඝාතකයින් විසින් සිවිල් වැසියන් සුදු වෑන් රථ යොදා පැහැර ගෙන යන අතර, ඔවුන් ගේ මළ සිරුර හමුනොවුනහොත්, යළි කිසි දිනෙක ඔවුන් ගැන තොරතුරක් දැන ගත නොහැකි විම් නිතර අසන්නට ලැබෙන අන්තරායකී.

ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගැනිමෙන් පසු මාස ගණනාවක් හෙළිදරව් නොකරන ස්ථානයන්හි රඳවා තබා ගන්නා අතර, තමන් ද්‍රවිඩ කොටි සංවිධානයේ සාමාජිකයෙක් යැයි පාපෝච්චාරණය කරන තුරු වධහිංසා පමුණුවනු ලැබේ.

තේවන් 2011 දී නිදහස් කරන තුරු අත්අඩංගුවේ සිටියදී අවමන් සහගත ලෙස සලකන ලද්දේය."ඔවුන් පෑන මගේ අතට දීලා මගේ ඉස්සරා පිට තිබු කොළ වලට අත්සන් කරන්න බල කළා. මම බැහැයි කිව්වාම මට තදින් ම පහර දුන්නා. එක් වේලාවක මගේ ඔළුව බිත්තියේ ගහපු වේලාවක ඔළු කට්ට පුපුරලා ලේ ආවා. ඒ තුවාලය තවම තියෙනවා." යනුවෙන් තේවන් ප්‍රකාශ කරන ලදී.

2008 දෙසැම්බර් 01 වන දින, ගෙවී ගිය දින කිහිපයෙහි වධහිංසාවන්ට ගොදුරු විමෙන්, සිට ගැනිමටවත් නොහැකි තරමට රෝගාතුර ව සිටි තේවන් රෝහල් ගත කරන ලැබ, ඔහු ගේ තුවාල වලට ප්‍රතිකාර කරනු ලැබීය.

රෝහලේ දී ඔහු ගේ දෑත් හා දෙපා වලට මංචු දමනු ලැබීය.

"ඔවුන් මාංචු ඉවත් කළේ මට වැසිකිලියට යාමට පමණයි. වැසිකිලි යාමේ දී පොලිස් නිලධාරීන් දෙදෙනෙක් මා සමඟ පැමිණි අතර, මට වැසිකිලිය පාවිච්චි කරන්නට සිදු වුයේ දොර විවෘතව තබා ගෙනය."

ඔහු අත්අඩංගුවට ගැනීමෙන් දෙසතියකට පසු තේවන් වවුනියා පොලිසියේ අපරාධ අංශයේ මුලස්ථානය වන කොළඹ අපරාධ කොට්ඨාශ මුලස්ථානයට බාර දෙනු ලැබීය.
මාස හතරකට පසු ඔහු ප්‍රධාන බන්ධනාගාරයට මාරු කරනු ලැබීය.

මේ වනතුරුත් තේවන්ට චෝදනා පත්‍රයක් යටතේ නඩු පවරා නොමැත. ඔහු තවමත් තමා අත් අඩංගුවේ තබා ගෙන සිටින්නේ මන්දැයි යන්න හෝ තමාට අවමන් සහගත ලෙස සලකන්නේ මන්දැයි නොදනී.

ඔහු කොළඹ අධි ආරක්ෂිත බන්ධනාගාරයක් වන වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටියදී, සෑම දින 14කට වරක්ම තවත් රැඳවියන් 70 දෙනෙකු සමඟ මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට පමුණුවනු ලැබීය.

මෙම නඩු විභාගය රැඳවුම් නියෝගය දිර්ඝ කිරීමේ රබර් මුද්‍ර තැබීමට පමණක් සීමා වන අතර, මහේස්ත්‍රාත්වරයා තේවන් ට හෝ අනෙක් රැඳවියන්ට 'කීමට යමක් තිබේ' දැයි විමසන්නටවත් කාලයක් නොගනී.

බන්ධනාගාර තුළ ජීවිතය තේවන් වැන්නන්ට ඉතාමත් දුෂ්කර එකක් වුයේය. බන්ධනාගාර නිලධාරීන් එල්. ටී. ටී. ඊ. සැකකරුවන් ලෙස බන්ධනාගාර ගත කොට ඇති තැනැත්තන්ට පහර දීමට අනෙකුත් සිරකරුවන් යොදා ගනිති. තේවන් ඇතුළු අනෙකුත් එල් ටී ටී ඊ සැකකරුවන් මෙම හිරිහැර වලට ගොදුරු වු අතර බොහෝ අවස්ථාවල අනෙකුත් සිරකරුවන් ඉදිරියේ නිරුවත් කිරිම හා ලිංගික අතවර වලට ලක් කරන ලැබීය.

“තේවන් ගේ කථා පුවත ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය ක්‍රියාත්මක වන දුර්වල ආකාරය ඉතා පැහැදිලිව ප්‍රදර්ශණය කරන බව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ ආසියානු-පැසිෆික් කලාපීය අධ්‍යක්ෂ පෝල් ට්‍රස්ට්කෝට් ප්‍රකාශ කරයි.

“ඔහු නොකඩවාම වධහිංසාවන්ට භාජනය කළ අතර ඔහුට විරුද්ධව චෝදනා ගොනු කිරිම සිදුවන්නේ දිනයකින් දෙකින් ද එසේ නැත්නම් මාසයකින් දෙකින් ද එසේත් නැත්නම් වසර තිහකින් ද යන්න පිළිබඳ කිසිදු අදහසක් නොවිය. යථාර්ථීය නම් ඔහුට එරෙහිව කිසිම චෝදනාවක් නොවීමයි. මෙය නියත වශයෙන්ම ශ්‍රී ලංකාවේ පවතින තත්වයෙහි වරද පෙන්වයි”

## නිදහසෙහි මිළ

තේවන් මෙලෙස කවද තමා නිදහස් වේදැයි කල්පනා කරමින් සිටින අතර ඔහුගේ පවුලේ උදවිය නීතිඥවරුන්ට ගෙවිමටත් මුදල් ඉතිරි කරන්නට වැයම් කරමින්, අල්ලසින් හා දූෂණයෙන් පිරුණු බන්ධානාගාර පද්ධතිය තරණය කිරීමේ දුෂ්කර ව්‍යායාමයේ නිරතව සිටියේය.

තේවන් ගේ ඥාතීන් ගේ තර්කය වුයේ අල්ලස් නිසා තේවන් නිදහස් වු බවයි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවෙන් පිටත නිදහසේ ජීවත් වන තේවන් තමා අත් විඳින අවමන් සහගත සැලකිල්ලිවලට සාධාරණයක් ඉෂ්ට වේයැයි විශ්වාස නොකරයි.

“මම බන්ධනාගාරයෙන් නිදහස් වුයේ අන් කිසිවක් නිසා නොව මගේ පවුලේ අය ඒ මිල ගෙවන ලද නිසයි. ඇත්තටම මාව අත් අත්ඩංගුවට ගත්තේ මගෙන් සල්ලි ගන්න ඕන නිසයි. මට විරුද්ධව කිසිම දවසක චෝදනා විභාග කිරිමක් කළේ නැහ. මට දෙන ලද වධහිංසා ගැනත් කිසිම විභාගයක් කළේ නැහ. පවතින ක්‍රමය යටතේ කිසිම දවසක සාධාරණය ඉටු වෙන්නේ නැහ. තේවන් කියා සිටියේය.

වැඩි විස්තර පිණිස-1 May 2013 'There are no human rights in Sri Lanka' (feature)http://www.amnesty.org/en/news/there-are-no-human-rights-sri-lanka-2013-05-01